**අයදුම්පත් කැඳවීම - ශ්‍රී ලංකාවේ මැතිවරණ කාලය තුළ දුස්තොරතුරු,අසත්‍යය හා විකෘති කරන ලද තොරතුරු සහ අසත්‍යය ප්‍රකාශ ව්‍යාප්ත වීම අවම කිරීමේ අරමුණින් අන්තර්ගත ( Content) නිර්මාණය කිරීම.**

**ආරම්භක දිනය:** 2025 අප්‍රේල් 15

**කාලසීමාව:** 2025 අප්‍රේල් 15 – 2026 අප්‍රේල් 30

**ස්ථානය:** ශ්‍රී ලංකාව

**හැඳින්වීම**

Factum යනු ජාත්‍යන්තර සබඳතා, තාක්ෂණික සහයෝගීතාවය, මූලධර්ම සහ සන්නිවේදනය, ඩිජිටල් අන්තර්ගත කළමනාකරණය සහ දේශගුණික අවධානය ආදී ක්ෂේත්‍රවල ක්‍රියාත්මක වන ස්වාධීන ආයතනයකි.

අපගේ විශේෂඥය කණ්ඩායම ආසියානු කලාපය තුළ ස්වාධීන පර්යේෂණ, ගැඹුරු විශ්ලේෂණ, ප්‍රතිපත්ති සැලසුම් වැනි විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ව්‍යාපෘති දියත් කරයි.

**Factum සහ Germany හි DRI ආයතනය එක්ව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන Strengthening Resilience against Disinformation (and Harm) in Sri Lanka** මැතිවරණ සමයේ සිදුවන ඩිජිටල් අන්තර්ගත (Content) හරහා සිදු වන දුස්තොරතුරු, අසත්‍යය තොරතුරු සහ වැරදි තොරතුරු සහ ඒවායේ අන්තර්ගතය විශ්ලේෂණය කරමින් සමාජ මාධ්‍ය වේදිකාවන් වෙත වාර්තා කිරීමට අරමුණු කර ඇත. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය 2026 දක්වා ක්‍රියාත්මක වීමට නියමිතය.

**තොරතුරු සැසිය:**

**මෙම ව්‍යාපෘතියට සම්බන්ධවීමට අපේක්ෂා කරන ආයතන නියෝජිතයන්ට මූලික තොරතුරු සැසියක් 2025 මාර්තු මස 21ක් වන දින Factum Solution,29A,Mirane Drive, Colombo 03 උදෑසන 10.30 ට පැවැත්වීමට කටයුතු යොදා ඇති අතර වැඩිදුර විමසීම් සඳහා පහනි වීරක්කොඩි** [pahani@factum.lk](mailto:pahani@factum.lk) **(ව්‍යාපෘති සම්බන්ධීකාරක) හෝ මොහොමඩ් ශෆ්කත්** [shafkath@factum.lk](mailto:shafkath@factum.lk) **(සන්නිවේදන සහකාරක)** ඊමේල් මාර්ගයෙන් සම්බන්ධ වන්න**.**

---

Funded by the European Union

යුරෝපා සංගමය විසින්මෙ ම යෝජනා කැඳවීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන අතර , Democracy Reporting International(DRI) සහ Factum සහයෝගීතත්වයෙන් ක්‍රියාත්මක කරන "ශ්‍රී ලංකාවේ මැතිවරණ සමයේ දුස්/අසත්‍යය සහ විකෘති කරන ලද තොරතුරු අවම කර ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේ " ව්‍යාපෘතියේ අංගයක් වේ

**ඉලක්ක සහ අපේක්ෂිත ප්‍රතිඵල:**

දුස්තොරතුරු,අසත්‍යය තොරතුරු සහ විකෘති කරන ලද තොරතුරු ව්‍යාප්ත වීම අවම කිරීමට සහ ඒ තුලින් සිදු වන මාර්ගගත හානියන්ට මුහුණදීමට අවශ්‍යය මග පෙන්වීම ලබා දෙන නිර්මාණ නිර්මාණය කිරීමට මෙම ව්‍යාපෘතිය ඔස්සේ පහත සඳහන් කාණ්ඩ සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

- **LOT#1: වීඩියෝ අන්තර්ගතයන් නිර්මාණය කිරීම.** (වෙන් කර ඇති මුළු මුදල: යුරෝ 23,000 **එක් සංවිධානයක් පමණක් මේ සඳහා තෝරාගනු ලැබේ)**
- **LOT#2: සම්මුඛ සාකච්චා ආකාරයේ සහ නිර්මාණශීලි ශ්‍රව්‍යය දෘෂ්‍යය ආකාරයේ අන්තර්ගතයන් නිර්මාණය කිරීම** (වෙන් කර ඇති මුළු මුදල : 40,000 **ආයතන හතරක් ඒ සඳහා තෝරාගනු ලැබේ)**
- **LOT#3: ලිපි, ප්‍රවෘත්ති සහ සමාජ මාධ්‍ය පළ කිරීම්** (වෙන් කර ඇති මුළු මුදල: යුරෝ 12,000 **සංවිධාන තුනක් ඒ සඳහා තොර ගනු ලැබේ)**

---

මෙම වැඩසටහනේදී, සමස්ථ නිර්මාණ 100ක් නිෂ්පාදනය කිරීමට අපේක්ෂිතය.මෙයට වීඩියෝ, රීල්(Reel), මීම්(mems), සහ ලිපි ඇතුළත් වේ.

**අන්තර්ගත නිර්මාණය සඳහා භාවිත වන උපදෙස් :**

- **ව්‍යාපෘතිය සම්බන්ධ විශේෂඥයින්(Fact checkers),** සහ **අන්තර්ගත නිර්මාණකරුවන්(content creators)** යන දෙපාර්ශවයම සමඟ හවුල් වී **දුස්/අසත්‍යය හා විකෘති කරන ලද පුවත් සම්බන්ධයෙන් විශ්ලේෂණය කිරීම**
- **මූලික පද සෙවීම් (Keywords), සංවේදීත්ව විශ්ලේෂණය (Sentiment Analysis),** සහ **තොරතුරු සැබෑකරණය(fact checking) කිරීම** යොදා ගනිමින් නිශ්චිත ප්‍රතිචාර සැලසුම් කිරීම.
- **මෙම සිදු කරන නිර්මාණ රටේ සංස්කෘතිය සහ සමාජ සංවේදිතාවන් වලට අනුකූලව සිදු කිරීම වැදගත් වේ.**
- **අන්තර්ගත නිර්මාණයේදී දත්ත පදනම් කරගනිමින් නිර්මාණය කල යුතු අතර රටේ වලංගු නිතිරිතින්ට අනුගත වෙමින් ඒවා නිර්මාණය කල යුතුය.**

Funded by the European Union

යුරෝපා සංගමය විසින්මෙ ම යෝජනා කැඳවීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන අතර , Democracy Reporting International(DRI) සහ Factum සහයෝගීතත්වයෙන් ක්‍රියාත්මක කරන “ශ්‍රී ලංකාවේ මැතිවරණ සමයේ දුස්/අසත්‍යය සහ විකෘති කරන ලද තොරතුරු අවම කර ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේ ” ව්‍යාපෘතියේ අංගයක් වේ

| LOT | ක්‍රියාකාරකමේ කාලසීමාව | අයදුම් කිරීමේ අවසන් දිනය |
| --- | --- | --- |
| **LOT #1** වීඩියෝ නිර්මාණ | 2025 අප්‍රේල් 15 වන දා සිට 2026 අප්‍රේල් 30 දක්වා | 2025 මාර්තු 30 දක්වා |
| **LOT #2** ශ්‍රව්‍ය, දෘෂ්‍යය අන්තර්ගත නිර්මාණ | 2025 අප්‍රේල් 15 වන දා සිට 2026 අප්‍රේල් 30 දක්වා | 2025 මාර්තු 30 දක්වා |
| **LOT #3** පුවත්/ලිපි සහිත අන්තර්ගත නිර්මාණ | 2025 අප්‍රේල් 15 වන දා සිට 2026 අප්‍රේල් 30 දක්වා | 2025 මාර්තු 30 දක්වා |

Funded by the European Union

යුරෝපා සංගමය විසින්මෙ ම යෝජනා කැඳවීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන අතර , Democracy Reporting International(DRI) සහ Factum සහයෝගීතත්වයෙන් ක්‍රියාත්මක කරන "ශ්‍රී ලංකාවේ මැතිවරණ සමයේ දුස්/අසත්‍යය සහ විකෘති කරන ලද තොරතුරු අවම කර ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේ " ව්‍යාපෘතියේ අංගයක් වේ

**LOT#1 – මැතිවරණ සම්බන්ධයෙන් විකාශනය වන දුස්/අසත්‍ය සහ විකෘති කරන ලද තොරතුරු හා මැතිවරණය පිළිබඳ පුද්ගල විශ්වාසනියත්වයට හානිකර අන්තර්ගතය අවම කිරීම සඳහා වීඩියෝ නිර්මාණය කිරීම**

පසුබිම

ඩිජිටල් යුගයේ, දේශපාලනයමය දුස්/අසත්‍ය/විකෘති/ අනිසි තොරතුරු සහ අන්තර්ජාල බලපෑම්, විශේෂයෙන් මැතිවරණ සමයේ, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියට දැඩි අභියෝගයක් වේ. මෙම අභියෝගවලට ප්‍රතිචාර දැක්වීම සඳහා, මැතිවරණ සම්බන්ධව පැතිරෙන දුස්/අසත්‍ය හා විකෘති කරන ලද තොරතුරු අවම කිරීමට උපකාරී වන, දැනුම ප්‍රවර්ධනය වන , ආකර්ෂණීය සහ පහසුවෙන් බෙදාහැරිය හැකි වීඩියෝ 25ක් නිර්මාණය කිරීමට යෝජනා කැඳවනු ලැබේ.

**මූලික තොරතුරු:**

- **තෝරාගනු ලබන්නේ එක් අන්තර්ගත නිර්මාණ(content creation) කරනු ලබන ආයතනයක් පමණි.**
- **සමාජ මාධ්‍ය සහ අනෙකුත් ඩිජිටල් වේදිකා හරහා මෙම අන්තර්ගතය බෙදා හැරීය යුතුය.**
- **ගිවිසුම් කාලය:** 2025 අප්‍රේල් 15 වන දා සිට 2026 අප්‍රේල් 30 දක්වා
- **වෙන් කර ඇති මුදල : ආසන්න වශයෙන් 23000 EUR (යුරෝ) මුදලකි.**

---

**ප්‍රධාන කාර්යයන්**

**1. අන්තර්ගත සම්බන්ධයෙන් උපායමාර්ගය සකස් කිරීම**

- මැතිවරණ සමයේ දුස්/අසත්‍යය හා විකෘති කරන ලද තොරතුරු වලට ප්‍රතිචාර දැක්වීමට සමත් අන්තර්ගත උපායමාර්ගයක්(Content strategy) නිර්මාණය කල යුතුය.
- දුස්/අසත්‍යය හා විකෘති කරන ලද තොරතුරු හඳුනා ගනිමින් , එයට ප්‍රතිවිරුද්ධව ක්‍රියා කිරීමට මග පෙන්වීම ලැබෙන ආකාරයේ අධ්‍යාපනමය සහ තොරතුරුමය දැනුම ලැබෙන වීඩියෝ නිර්මාණය කල යුතුය.
- සිංහල සහ දෙමළ භාෂා භාවිතා කරන්නන් හට පහසුවෙන් අවබෝධ කරගත හැකි ලෙස අන්තර්ගතය නිර්මාණය කල යුතුය.

Funded by the European Union

යුරෝපා සංගමය විසින්මෙ ම යෝජනා කැඳවීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන අතර , Democracy Reporting International(DRI) සහ Factum සහයෝගීතත්වයෙන් ක්‍රියාත්මක කරන "ශ්‍රී ලංකාවේ මැතිවරණ සමයේ දුස්/අසත්‍යය සහ විකෘති කරන ලද තොරතුරු අවම කර ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේ " ව්‍යාපෘතියේ අංගයක් වේ

**2. අන්තර්ගතය සමාජ මාධ්‍ය හරහා බෙදාහැරීම**

- Facebook, YouTube, Instagram, TikTok සහ X වැනි ප්‍රධාන සමාජ මාධ්‍ය වේදිකා භාවිතයෙන් බෙදාහැරීම කල යුතුය.
- WhatsApp වැනි පණිවිඩ යැවීමේ යෙදුම් හරහා ද මෙම නිර්මාණ ප්‍රචලිත කල යුතුය.
- අනිසි තොරතුරු ව්‍යාප්ත වන වහාම එයට ප්‍රතිචාර දැක්වීමට හැකි දැනුම ලැබෙන වීඩියෝ සහ අන්තර්ගතය නිර්මාණය කල යුතුය.

**3. ඩිජිටල් ප්‍රජාතන්ත්‍රවාදී යාන්ත්‍රණයට (DDM) සම්බන්ධ වීම**

- මැතිවරණ සම්බන්ධව පැතිරෙන දුස්/අසත්‍යය හා විකෘති කරන ලද තොරතුරු අවම කරන අනෙක් ආයතන හා එක්ව වැඩ කිරීම අපේක්ෂා කෙරේ.
- සමාජ මාධ්‍ය ජාල හරහා ප්‍රවර්ධන සහ සහයෝගීතා වැඩසටහන් සංවිධානය කිරීම ද අපේක්ෂා කෙරේ.

**4. බලපෑම ඇගයීම**

- මෙම නිර්මාණ සම්බන්ධයෙන් ජනතා ප්‍රතිචාරයන් සහ ඔවුන්ගේ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කල යුතුය(කමෙන්ට්comment,රිඇක්ට්react භාවිතයෙන් කිරීම ප්‍රමාණවත් වේ)
- නිර්මාණය සඳහා විශ්ලේෂණ, ජනතා අදහස් විමසීම සහ කණ්ඩායම් සාකච්ඡා පැවැත්වීම මඟින් අන්තර්ගතයේ බලපෑම මැන ගැනීම.
- වාර්තා ඉදිරිපත් කිරීම:
    - 3 මසකට වරක් වාර්තා ඉදිරිපත් කල යුතුය.
    - මැතිවරණ සමයේදී, එක් මාසයකට වරක් වාර්තා ඉදිරිපත් කල යුතුය.

---

**අපේක්ෂිත ඉලක්ක (Deliverables) සහ මූලික දක්ෂතා (KPIs)**

✅ **අන්තර්ගත උපායමාර්ගය:**

- ඉලක්කගත ප්‍රේක්ෂකයන්, තේමාවන් සහ ප්‍රධාන පණිවුඩ පිළිබඳ මන අවබෝධයක් තිබිය යුතුය.

Funded by the European Union

යුරෝපා සංගමය විසින්මෙ ම යෝජනා කැඳවීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන අතර , Democracy Reporting International(DRI) සහ Factum සහයෝගීතත්වයෙන් ක්‍රියාත්මක කරන "ශ්‍රී ලංකාවේ මැතිවරණ සමයේ දුස්/අසත්‍යය සහ විකෘති කරන ලද තොරතුරු අවම කර ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේ " ව්‍යාපෘතියේ අංගයක් වේ

✅ **වීඩියෝ සහ මල්ටිමීඩියා අන්තර්ගත නිර්මාණය:**

- දුස්/අසත්‍ය සහ විකෘති කරන ලද තොරතුරු හඳුනා ගන්නා සහ ඒවා සංසරණය වීම අවම කරන විශේෂිත වීඩියෝ 25ක් නිර්මාණය කල යුතුය.
- සිංහල සහ දෙමළ ජනතාව අතරට පැතිරවිය හැකි අන්තර්ගත නිර්මාණය කල යුතුය

✅ **අන්තර්ගත බෙදාහැරීම සහ සම්බන්ධතාවය:**

- විවිධ ජාතික සහ ප්‍රාදේශීක ජනතාව අතර අන්තර්ගතය බෙදාහැරීම කල යුතුය.
- සමාජ මාධ්‍ය යෙදුම් හරහා වැඩිම සම්බන්ධතාවයක් සහ ආවරණයක් ලබාගැනීම කල යුතුය.

✅ **බලපෑම් වාර්තා:**

- අන්තර්ගතය ප්‍රවර්ධනය , සම්බන්ධතාවය සහ බලපෑම් මැන ගැනීම කල යුතුය.
- ජනතාවගේ අදහස් සහ ප්‍රතිචාර සැලකීම කල යුතුය.
- 

---

**අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

✅ **ශ්‍රී ලංකාවේ නිත්‍යානුකූල ලෙස ලියාපදිංචි ආයතනයක් විය යුතුය.**

✅ **අන්තර්ගත නිර්මාණය සහ සමාජ මාධ්‍ය හරහා ප්‍රවර්ධනය පිළිබඳ පළපුරුද්ද තිබිය යුතුය.**

✅ **ශ්‍රී ලංකාවේ දේශපාලන සහ මැතිවරණ පරිසරය පිළිබඳ හොඳ අවබෝධයක් තිබිය යුතුය.**

✅ **ආර්ථික සහ සංස්කෘතික බලපෑම් පිළිබඳව මනා අවබෝධයක් තිබිය යුතුය.**

---

**මේ සඳහා වෙන්කල අයවැය - 23000 EUR**

🟢 **භාවිත කළ හැකි වියදම්:**

**උදාහරණ:**

- කාර්ය මණ්ඩල වැටුප්
- විශේෂඥ ගිවිසුම් සහ ගාස්තු
- ස්ටුඩියෝ වියදම්
- නළුවන්/නිවේදකයන් ගාස්තු
- ගමන් සහ නවාතැන් වියදම්
- පළපුරුදු කළමනාකරණය සඳහා වියදම් (සංස්කරණය, නිර්මාණය)
- උපකරණ කුලියට ගැනීම
- 

---

Funded by the European Union

යුරෝපා සංගමය විසින්මෙම යෝජනා කැඳවීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන අතර , Democracy Reporting International(DRI) සහ Factum සහයෝගීතත්වයෙන් ක්‍රියාත්මක කරන “ශ්‍රී ලංකාවේ මැතිවරණ සමයේ දුස්/අසත්‍යය සහ විකෘති කරන ලද තොරතුරු අවම කර ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේ ” ව්‍යාපෘතියේ අංගයක් වේ

**අයදුම් කිරීමේ ආකාරය**

📩 **විමසුම් හා යෝජනා ඉදිරිපත් කිරීම සඳහා**

📧 **ඊමේල්:** pahani@factum.lk

📌 **විෂය:** “Video Content Creations”

📅 **අවසන් දිනය:** 2025 මාර්තු 30

**අයදුම්පත සමඟ අඩංගු කළ යුතු ලියකියවිලි:**

- ✅ ඔබේ පෙර කළ වැඩ සහිත වාර්තාවක් **(Portfolio)** ( එක පිටුවකට සීමා වන්න)
- ✅ **සමාජ මාධ්‍ය සම්බන්ධතාව මැන ගැනීමේ තොරතුරු (Engagement Metrics)** ( එක පිටුවකට සීමා වන්න)
- ✅ **සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය**
- ✅ උපරිම **23000 EUR** අයවැය සහිත සම්පූර්ණ මූල්‍ය සැලැස්ම

Funded by the European Union

යුරෝපා සංගමය විසින්මෙ ම යෝජනා කැඳවීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන අතර , Democracy Reporting International(DRI) සහ Factum සහයෝගීතත්වයෙන් ක්‍රියාත්මක කරන “ශ්‍රී ලංකාවේ මැතිවරණ සමයේ දුස්/අසත්‍යය සහ විකෘති කරන ලද තොරතුරු අවම කර ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේ ” ව්‍යාපෘතියේ අංගයක් වේ

factum

DEMOCRACY REPORTING INTERNATIONAL

## LOT#2 – මැතිවරණ සමයේ දුස්/අසත්‍ය හා විකෘති කරන ලද තොරතුරු අවම කිරීම සඳහා වීඩියෝ, ශ්‍රව්‍ය සහ සාකච්ඡා මත පදනම් වූ අන්තර්ගත නිර්මාණය

## පසුබිම

දුස්/අසත්‍යය හා විකෘති කරන ලද තොරතුරු සහ අන්තර්ජාල බලපෑම්, විශේෂයෙන් මැතිවරණ සමයේදී, ප්‍රජාතන්ත්‍රවාදයට දැඩි අභියෝගයකි.මෙම අභියෝගවලට ප්‍රතිචාර දැක්වීම සඳහා, මැතිවරණ සම්බන්ධව පැතිරෙන දුස්/අසත්‍යය හා විකෘති කරන ලද තොරතුරු අවම කිරීම සඳහා වීඩියෝ, ශ්‍රව්‍ය සහ සාකච්ඡා මත පදනම් වූ අන්තර්ගත නිර්මාණය කිරීමට යෝජනා කැඳවනු ලැබේ. මෙය ජනතාවට විශ්වාසනීය තොරතුරු සැපයීම සහ මැතිවරණ වල නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා විශේෂිත ආකර්ශනීය අන්තර්ගතයක් නිර්මාණය කිරීමේ වැඩසටහනකි.

**මූලික තොරතුරු**

- **සියළුම අන්තර්ගත නිර්මාණය සඳහා දෘෂ්‍යය හා ශ්‍රව්‍ය මාධ්‍ය භාවිත කරනු ඇත.**
- **අවශ්‍ය විධිමත් නිර්මාණය සඳහා සිංහල හෝ දෙමළ භාෂාවන් භාවිතා කළ යුතුය.**
- **ප්‍රජාතන්ත්‍රවාදයට බලපෑම් කරන ව්‍යාජ තොරතුරු වලට ප්‍රතිචාර දැක්වීම අරමුණු කල යුතුය.**
- **ගිවිසුම් කාලය:** 2025 අප්‍රේල් 15 වන දා සිට 2026 අප්‍රේල් 30 දක්වා **දක්වා වේ.**
- **ආයතන 4 ක් තෝරාගනු ඇත.**
- **ආසන්න වශයෙන් 10000 EUR (යුරෝ)ක් එක ආයතනයක් සඳහා වෙන් කර ඇත.**
-

---

**ප්‍රධාන කාර්යයන්**

**1. අන්තර්ගත උපායමාර්ගය** (Content strategy) **සංවර්ධනය කිරීම**

- මැතිවරණ සම්බන්ධව පැතිරෙන දුස්/අසත්‍යය හා විකෘති කරන ලද තොරතුරු අවම කිරීමට යෝජිත උපායමාර්ගයක් සකස් කල යුතුය.
- විශේෂයෙන් ජනතාවට තොරතුරු සපයන අතරම ආකර්ශනීය සහ පහසුවෙන් බෙදාහැරිය හැකි අන්තර්ගත නිර්මාණය කල යුතුය.
- සිංහල හෝ දෙමළ ජනතාව අතර දුස්/අසත්‍යය හා විකෘති කරන ලද තොරතුරු අවම කිරීමේ අරමුණින් උපායමාර්ගයන් සැලසුම් කල යුතුය.

Funded by the European Union

යුරෝපා සංගමය විසින්මෙ ම යෝජනා කැඳවීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන අතර , Democracy Reporting International(DRI) සහ Factum සහයෝගීතත්වයෙන් ක්‍රියාත්මක කරන “ශ්‍රී ලංකාවේ මැතිවරණ සමයේ දුස්/අසත්‍යය සහ විකෘති කරන ලද තොරතුරු අවම කර ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේ ” ව්‍යාපෘතියේ අංගයක් වේ

**2. වීඩියෝ, ශ්‍රව්‍ය සහ සාකච්ඡා මත පදනම් වූ අන්තර්ගත නිර්මාණය කිරීම**

- ප්‍රවීණයන් සහ ප්‍රජා නායකයන් ඇතුළත් වීඩියෝ සාකච්ඡා, පොඩ්කාස්ට්(podcast) සහ ශ්‍රව්‍ය(Audio) කතා සිදු කල යුතුය.
- කෙටි සහ දිගු දුස්/අසත්‍යය හා විකෘති කරන ලද තොරතුරු පිළිබඳ අධ්‍යාපනමය දැනුම ලැබෙන සහ විස්තරාත්මක වීඩියෝ නිර්මාණය කල යුතුය.
- විවිධ ජනතාවට පහසුවෙන් අවබෝධ කරගත හැකි අන්තර්ගත නිර්මාණය කල යුතුය.

**3. අන්තර්ගතය සමාජ මාධ්‍ය සහ අනෙකුත් මාධ්‍ය හරහා බෙදාහැරීම**

- Facebook, YouTube,Instagram, TikTok, X, WhatsApp සහ Telegram වැනි වේදිකාවන් හරහා අන්තර්ගතය බෙදාහැරීම කල යුතුය.
- මාධ්‍යය ආයතන අතර අන්තර්ගත බෙදාහැරීම සිදු කල යුතුය.
- විශේෂයෙන් මැතිවරණ සමයේදී මනා ලෙස මැතිවරණ ප්‍රේක්ෂකයන් අතරට එම අන්තර්ගතය ලබාදීම සිදු කල යුතුය.

**4. බලපෑම මැන ගැනීම සහ වාර්තා ඉදිරිපත් කිරීම**

- අන්තර්ගතය පළ කිරීමෙන් පසු ජනතා ප්‍රතිචාර මැන ගැනීම කල යුතුය.
- සමාජ මාධ්‍ය විශ්ලේෂණය, කණ්ඩායම් සාකච්ඡා මඟින් අන්තර්ගතයේ බලපෑම මැන ගැනීම කල යුතුය.
- වාර්තා ඉදිරිපත් කිරීම:
  - ත්‍රෛමාසික වාර්තා (සෑම මස 3කට වරක්)
  - මැතිවරණ සමයේදී, මසකට වරක් වාර්තා ඉදිරිපත් කිරීම.

---

**බලාපොරොත්තු (Deliverables) සහ ප්‍රධාන දක්ෂතා (KPIs)**

✅ **අන්තර්ගත උපායමාර්ගය:**

- මැතිවරණ සම්බන්ධව දුස්/අසත්‍යය හා විකෘති කරන ලද තොරතුරු අවම කිරීමට ගැලපෙන මූලික උපායමාර්ගයක් සකස් කල යුතුය.

  ✅ **වීඩියෝ, ශ්‍රව්‍ය සහ සාකච්ඡා අන්තර්ගත නිර්මාණය:**
- ප්‍රවීණයන් සහ ප්‍රජා නායකයන්ගේ විශේෂිත සාකච්ඡා සහ වීඩියෝ නිර්මාණය කල යුතුය.

  ✅ **අන්තර්ගත බෙදාහැරීම සහ සම්බන්ධතාවය:**
- විවිධ ප්‍රදේශවල ජනතාව අතර අන්තර්ගතය බෙදාහැරීම කල යුතුය.
- 

Funded by the European Union

යුරෝපා සංගමය විසින්මෙ ම යෝජනා කැඳවීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන අතර , Democracy Reporting International(DRI) සහ Factum සහයෝගීතත්වයෙන් ක්‍රියාත්මක කරන “ශ්‍රී ලංකාවේ මැතිවරණ සමයේ දුස්/අසත්‍යය සහ විකෘති කරන ලද තොරතුරු අවම කර ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේ ” ව්‍යාපෘතියේ අංගයක් වේ

✅ **බලපෑම් වාර්තා:**

- අන්තර්ගතය ව්‍යාප්ත වීමේ , සම්බන්ධතාවය සහ බලපෑම් මැන ගැනීම කල යුතුය.
- ජනතාවගේ අදහස් සහ ප්‍රතිචාර සැලකීම.
-

---

**අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

✅ **ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූල ලෙස ලියාපදිංචි ආයතනයක් විය යුතුය.**
✅ **අන්තර්ගත නිර්මාණය සහ සමාජ මාධ්‍ය හරහා ප්‍රවර්ධනය පිළිබඳ පළපුරුද්ද තිබිය යුතුය.**
✅ **ශ්‍රී ලංකාවේ මැතිවරණ පරිසරය පිළිබඳ හොඳ අවබෝධයක් තිබිය යුතුය.**
✅ **සිංහල සහ දෙමළ ප්‍රජාවන් සමඟ වැඩ කර ඇති අත්දැකීම් තිබිය යුතුය.**

---

**මේ සඳහා වෙන්කල අයවැය - 10000 EUR**
🟢 **භාවිත කළ හැකි වියදම්:**
**උදාහරණ;**

- කාර්ය මණ්ඩල වැටුප්
- විශේෂඥ ගිවිසුම් සහ ගාස්තු
- ස්ටුඩියෝ වියදම්
- නළුවන්/නිවේදකයන් ගාස්තු
- ගමන් සහ නවාතැන් වියදම්
- නිෂ්පාදන සහ සංස්කරණ වියදම්
- උපකරණ කුලියට ගැනීම
-

---

**අයදුම් කිරීමේ ආකාරය**
📩 **විමසුම් හා යෝජනා ඉදිරිපත් කිරීම සඳහා**
📧 **ඊමේල්:** pahani@factum.lk
📌 **විෂය:** “Lot#2 - Video, Audio, and Interview Content Creation”

📅 **අවසන් දිනය:** 2025 මාර්තු 30

Funded by the European Union

යුරෝපා සංගමය විසින්මෙ ම යෝජනා කැඳවීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන අතර , Democracy Reporting International(DRI) සහ Factum සහයෝගීතත්වයෙන් ක්‍රියාත්මක කරන “ශ්‍රී ලංකාවේ මැතිවරණ සමයේ දුස්/අසත්‍යය සහ විකෘති කරන ලද තොරතුරු අවම කර ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේ ” ව්‍යාපෘතියේ අංගයක් වේ

**අයදුම්පත සමඟ අඩංගු කළ යුතු ලියකියවිලි:**

- ✅ ලියාපදිංචි ලියවිලි
- ✅ ඔබේ පෙර කල වැඩ සහිත වාර්තාවක් (Portfolio) සැකසිය යුතුය.
- ✅ සමාජ මාධ්‍ය සම්බන්ධතාව මැන ගැනීමේ විස්තර (Engagement Metrics)
- ✅ සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය
- ✅ උපරිම 10000 EUR අයවැය සහිත සම්පූර්ණ මූල්‍ය සැලැස්ම

Funded by the European Union

යුරෝපා සංගමය විසින්මෙ ම යෝජනා කැඳවීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන අතර , Democracy Reporting International(DRI) සහ Factum සහයෝගීතත්වයෙන් ක්‍රියාත්මක කරන "ශ්‍රී ලංකාවේ මැතිවරණ සමයේ දුස්/අසත්‍යය සහ විකෘති කරන ලද තොරතුරු අවම කර ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේ " ව්‍යාපෘතියේ අංගයක් වේ

DEMOCRACY
REPORTING
INTERNATIONAL

# LOT#3 – මැතිවරණ සමයේ දුස්/ අසත්‍යය හා විකෘති කරන ලද තොරතුරු අවම සඳහා ලිපි හා පුවත් ප්‍රකාශ සහිත අන්තර්ගත නිර්මාණය කිරීම.

## පසුබිම

දුස්/අසත්‍යය හා විකෘති කරන ලද තොරතුරු මැතිවරණ සම්බන්ධයෙන් ප්‍රචාරය වීම ප්‍රජාතන්ත්‍රවාදයට දැඩි බලපෑමක් ඇති කරයි. මෙම අභියෝග අවම කිරීම සඳහා, මැතිවරණ සම්බන්ධව පැතිරෙන දුස්/අසත්‍යය හා විකෘති කරන ලද තොරතුරු අවම කිරීම සඳහා උසස් තත්ත්වයේ පුවත් සහ ලිපි පළකිරීම සඳහා යෝජනා කැඳවනු ලැබේ. මෙම වැඩසටහන හරහා විශ්වාසනීය, තොරතුරුමය සහ සත්‍ය පදනම් කරගත් අන්තර්ගතය ජනතාවට ලබාදීමේ අරමුණ ඇත.

## ප්‍රධාන තොරතුරු

- **අන්තර්ගතය සිංහල හෝ දෙමළ භාෂාවලින් ලබාදිය යුතුය.**
- **ආර්ථික පර්යේෂණ සහ ප්‍රතිපත්ති ආයතන වැනි සංවිධාන 3ක් තෝරාගනු ඇත.**
- **ගිවිසුම් කාලය:** 2025 අප්‍රේල් 15 වන දා සිට 2026 අප්‍රේල් 30 දක්වා දක්වා
- **වෙන් කර ඇති මුදල : 5000 EUR (යුරෝ)ක් එක ආයතනයක් සඳහා වෙන් කර ඇත.**
- 

---

## මූලික කාර්යයන්

### 1. අන්තර්ගත උපායමාර්ගය (Content strategy) සංවර්ධනය කිරීම

- මැතිවරණ සම්බන්ධව පැතිරෙන දුස්/අසත්‍යය හා විකෘති කරන ලද තොරතුරු අවම කිරීමට ආකෘතිම ඉලක්කයන් (Narrative) සැලසුම් කල යුතුය.
- පරීක්ෂා කළ හැකි සහ පරීක්ෂා කළ සාක්ෂි මත පදනම්ව(Based on the fact) මාධ්‍ය අන්තර්ගතයන් නිර්මාණය කල යුතුය.
- මැතිවරණ සම්බන්ධයෙන් මතු වන දුස්/අසත්‍යය හා විකෘති කරන ලද තොරතුරු හඳුනාගෙන ඒවාට ප්‍රතිචාර දැක්වීමට අවශ්‍යය දැනුම ජනතාවට ලබා දිය යුතුය.

Funded by the European Union

යුරෝපා සංගමය විසින්මෙ ම යෝජනා කැඳවීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන අතර , Democracy Reporting International(DRI) සහ Factum සහයෝගීතත්වයෙන් ක්‍රියාත්මක කරන "ශ්‍රී ලංකාවේ මැතිවරණ සමයේ දුස්/අසත්‍යය සහ විකෘති කරන ලද තොරතුරු අවම කර ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේ " ව්‍යාපෘතියේ අංගයක් වේ

**2. ලිපි, පුවත් සහ විශ්ලේෂණ පළ කිරීම**

- විශ්වාසනීය සහ සාක්ෂි මත පදනම් වූ පුවත් ලිපි, විමර්ශනාත්මක වාර්තා සකස් කල යුතුය.
- මාධ්‍ය ආචාරධර්ම වලට (Journalistic ethics) අනුගතව නිවැරදිව සකස් කළ අන්තර්ගතය නිර්මාණය කිරීම කල යුතුය.
- ජනතාවට පහසුවෙන් අවබෝධ කරගත හැකි, සාක්ෂි සහිත අන්තර්ගතය ලිවීම කල යුතුය.
- නිර්මාණශීලි ජායාරූප ආකාරයේ අන්තර්ගතද නිර්මාණය කල යුතුය.

**3. අන්තර්ගත බෙදාහැරීම**

- පුවත් වෙබ් අඩවි, බ්ලොග් සහ සමාජ මාධ්‍ය (Facebook, TikTok,Instagram) හරහා අන්තර්ගතය ප්‍රචාරය කල යුතුය.
- අන් අන්තර්ගත නිර්මාණ ආයතනවලින් නිර්මාණය කර ඇති අන්තර්ගත සමඟ හවුල් වී ප්‍රචාරය කිරීම.
- සිංහල සහ දෙමළ මාධ්‍යය අතර අන්තර්ගතය බෙදාහැරීම කල යුතුය.

**4. බලපෑම මැන ගැනීම**

- ලිපි සහ පුවත් ප්‍රකාශන වලින් ඇතිවන බලපෑම යම් දුරකට අධීක්ෂණය කිරීම.
- දුස්/අසත්‍යය හා විකෘති කරන ලද තොරතුරු අවම කිරීම සාර්ථකද යන්න සොයා බැලිය යුතුය.

---

**අපේක්ෂිත ඉලක්ක (Deliverables) සහ මූලික දක්ෂතා (KPIs)**

✅ **අන්තර්ගත උපායමාර්ගය:**

- මැතිවරණ සම්බන්ධයෙන් දුස්/අසත්‍යය හා විකෘති කරන ලද තොරතුරු අවම කිරීමට ගැලපෙන මූලික උපායමාර්ගයක් සකස් කල යුතුය.

✅ **ලිපි සහ පුවත් ප්‍රකාශ නිර්මාණය:**

- විමර්ශනාත්මක වාර්තා, තත්ව විශ්ලේෂණ සහ මත විවරණ (Op-Eds) ලිවීම.

✅ **අන්තර්ගත බෙදාහැරීම:**

- පුවත් වෙබ් අඩවි, සමාජ මාධ්‍ය හරහා ලිපි පළ කිරීම.

Funded by the European Union

යුරෝපා සංගමය විසින්මෙ ම යෝජනා කැඳවීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන අතර , Democracy Reporting International(DRI) සහ Factum සහයෝගීතත්වයෙන් ක්‍රියාත්මක කරන “ශ්‍රී ලංකාවේ මැතිවරණ සමයේ දුස්/අසත්‍යය සහ විකෘති කරන ලද තොරතුරු අවම කර ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේ ” ව්‍යාපෘතියේ අංගයක් වේ

✅ **මාධ්‍ය සහ විශේෂඥ සහයෝගීතාව:**

- විශේෂඥ මත, විශ්ලේෂණ සහ පරීක්ෂා කළ හැකි තොරතුරු ඇතුළත් කිරීම.

✅ **බලපෑම් වාර්තා:**

- ලිපි පැතිරීම, සමාජ මාධ්‍ය සම්බන්ධතාවය සහ පරිශීලක ප්‍රතිචාර මැන ගැනීම.
- මැතිවරණ සමයේදී මසකට වරක් වාර්තා ඉදිරිපත් කිරීම.

---

**අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

✅ **ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූල ලෙස ලියාපදිංචි ආයතනයක් විය යුතුය.**

✅ **මාධ්‍ය, පුවත් ප්‍රකාශන සහ විමර්ශනාත්මක වාර්තා නිර්මාණය පිළිබඳ පළපුරුද්ද තිබිය යුතුය.**

✅ **ශ්‍රී ලංකාවේ මැතිවරණ පරිසරය සහ ව්‍යාජ තොරතුරු පැතිරීමේ රටාවන් පිළිබඳ අවබෝධයක් තිබිය යුතුය.**

✅ **සිංහල සහ දෙමළ භාෂාවලින් අන්තර්ගත නිර්මාණය කළ හැකි ආයතනයක් විය යුතුය.**

---

**මේ සඳහා වෙන්කල අයවැය - 5000 EUR**

🟢 **භාවිත කළ හැකි වියදම්:**

**උදාහරණ**

- කාර්ය මණ්ඩල වැටුප්
- මාධ්‍යවේදීන් සහ විශේෂඥයන් සඳහා ගිවිසුම්
- පර්යේෂණ සහ තොරතුරු පරීක්ෂා කිරීමේ වියදම්
- ගමන් සහ නවාතැන් වියදම්
- අන්තර්ගත බෙදාහැරීමේ වියදම්
- ඩිජිටල් ව්‍යාපාරික සහ ප්‍රචාරණ වියදම්

---

Funded by the European Union

යුරෝපා සංගමය විසින්මෙ ම යෝජනා කැඳවීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන අතර , Democracy Reporting International(DRI) සහ Factum සහයෝගීතත්වයෙන් ක්‍රියාත්මක කරන "ශ්‍රී ලංකාවේ මැතිවරණ සමයේ දුස්/අසත්‍යය සහ විකෘති කරන ලද තොරතුරු අවම කර ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේ " ව්‍යාපෘතියේ අංගයක් වේ

**අයදුම් කිරීමේ ආකාරය**

📩 **විමසුම් හා යෝජනා ඉදිරිපත් කිරීම සඳහා**

📧 **ඊමේල්:** [pahani@factum.lk](mailto:pahani@factum.lk)

📌 **විෂය:** “Lot#3 - Article and News Post Writing”

📅 **අවසන් දිනය:** 2025 මාර්තු 30

**අයදුම්පත සමඟ අඩංගු කළ යුතු ලියකියවිලි:**

✅ **සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය**

✅ ඔබේ පෙර කල වැඩ සහිත **වාර්තාවක් (Portfolio) (එක පිටුවකට සීමා කරන්න)**

✅ **සමාජ මාධ්‍ය සම්බන්ධතාව මැන ගැනීමේ විස්තර (Engagement Metrics) (එක පිටුවකට සීමා කරන්න)**

✅ උපරිම **5000 EUR** අයවැය සහිත සම්පූර්ණ මූල්‍ය සැලැස්ම

Funded by the European Union

යුරෝපා සංගමය විසින්මෙ ම යෝජනා කැඳවීම සදහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන අතර , Democracy Reporting International(DRI) සහ Factum සහයෝගීතත්වයෙන් ක්‍රියාත්මක කරන “ශ්‍රී ලංකාවේ මැතිවරණ සමයේ දුස්/අසත්‍යය සහ විකෘති කරන ලද තොරතුරු අවම කර ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේ ” ව්‍යාපෘතියේ අංගයක් වේ